සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## වර්ෂ අවසාන ඇගයීම - 2013

11084

## 6 - ශ්‍රේණිය

## නර්තනය

නම/විභාග අංකය :- ...................................................................... කාලය : පැය 01 1/2යි.

❖ දී ඇති උපදෙස් හොඳින් කියවන්න.

❖ අංක 01 සිට 15 දක්වා ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුයි. අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න තෝරා ගත යුත්තේ ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායට අයත් කොටසෙනි.
උදා : ඔබ ඉගෙන ගන්නේ උඩරට නර්තන සම්ප්‍රදාය නම් පිළිතුරු ලිවිය යුත්තේ එම කොටසට අයත් අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට පමණි.

❖ I කොටස සඳහා ඔබ පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 20කි.

## I කොටස

❖ **නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. නර්තනයේ මූලික අංගහාරය හඳුන්වනු ලබන්නේ,
   (1) ගොඩ සරඹ නමිනි. (2) නමස්කාරය නමිනි.
   (3) මණ්ඩිය නමිනි. (4) හමාර පදය නමිනි.

2. මාත්‍රා 2 + 2 තනි තිත අනුව තාල තැබිය හැකි රබන් පදයකි,
   (1) තුං තුඹ ගෙඩි තුනයි තුනයි.
   (2) උස් උස් ගස්වල දික් දික් පත් කොළ.
   (3) රන් රඹුටන් ගස් දෙකයි.
   (4) ඉහළ ගෙදර තුන්දෙනයි පහළ ගෙදර තුන්දෙනයි.

3. "අහසේ දෙවියෝ රුස්ව සිටින්නයි" මෙම කවිය,
   (1) ලී කෙළි කවියකි. (2) රබන් කවියකි.
   (3) කළගෙඩි කවියකි. (4) ගොයම් කවියකි.

4. නැති වූ කාන්තා ආභරණයක් සෙවීම පිළිබඳ ජන ක්‍රීඩාවක් වන්නේ,
   (1) කළගෙඩි සෙල්ලම. (2) එළුවන් කෑම. (3) ඔලිඳ කෙළිය. (4) මේවර කෙළිය.

5. සිංහල හා හින්දු අවුරුදු උත්සවය සමරනු ලබන්නේ,
   (1) සිංහල හා මුස්ලිම් ජාතිකයින්.
   (2) සිංහල හා දෙමළ ජාතිකයින්.
   (3) සිංහල හා බර්ගර් ජාතිකයින්.
   (4) සිංහල හා ඉංග්‍රීසි ජාතිකයින්.

❖ **පහත සඳහන් වාක්‍ය හරි නම් '✓' ලකුණ ද වැරදි නම් '×' ලකුණ ද වරහන් තුළ දමන්න.**

6. වන්නම්/ සරල කවි තාල සම්ප්‍රදායික නර්තන අංග වේ. (...............)
7. දේශීය නර්තන සම්ප්‍රදායන් පහක් ඇත. (...............)
8. ඇළ, දොළ, ගංගා, කඳුවැටි ආදිය පරිසරයේ දැකිය හැකි නිර්මිත වස්තූන් ය. (...............)
9. චරිත සඳහා නර්තන නිර්මාණයේ දී චරිත ස්වභාවය නිරීක්ෂණය ඉතා වැදගත් වේ. (...............)
10. ප්‍රසංගයක දී ඒකල හා සමූහ වශයෙන් නර්තන අංග ඉදිරිපත් කරයි. (...............)

❖ **නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යා කරන්න.**

| A | B |
|---|---|
| 11. පොසොන් උත්සවය | 1. සාමූහිකව වාදනය කරයි. |
| 12. තම්මැට්ටම | 2. බෞද්ධ ආගමික උත්සවයකි. |
| 13. රබන් පද | 3. නැටීමට පෙර හා නැටීමට පසු කරනු ලබයි. |
| 14. ප්‍රේක්ෂකයන් (නරඹන්නන්) | 4. සමූහ වාදන සඳහා භාවිත කරයි. |
| 15. නමස්කාර පදය | 5. ප්‍රසංගයක් නැරඹීමට අවශ්‍ය පිරිස. |

❖ **පහත සඳහන් II උඩරට, III පහතරට හා IV සබරගමු යන කොටස්වලින් එක් කොටසකට පමණක් පිළිතුරු සපයන්න.**

## II උඩරට

16. උඩරට නර්තන සම්ප්‍රදායෙහි පාද හුරු කරගැනීම සඳහා කරනු ලබන අභ්‍යාස හඳුන්වන්නේ,
(1) ගොඩ සරඹ නමිනි. (2) පා සරඹ නමිනි.
(3) කස්තිරම් නමිනි. (4) දොඹින පද නමිනි.

17. "තත් ජිත් තකජිත් තත් ජිත් තොංනං තා " මේ ලෙස නටනු ලබන්නේ,
(1) පළමු වන ගොඩ සරඹයේ කස්තිරම යි. (2) පළමු වන පා සරඹයේ හමාර පදය යි.
(3) දෙවන ගොඩ සරඹයේ කස්තිරම යි. (4) දෙවන ඉලංගම් සරඹයේ ඉරට්ටිය යි.

18. ''ගිරින් ගිරට පැන................ පුබුදමින් අරුණ කළ මා'' මෙම කවි පදයේ හිස්තැනට අදාළ වචන යුගලය වන්නේ,
(1) තුරින් තුරට. (2) වට පිටින්. (3) සට පටින්. (4) ලැගුම් සොයා.

19. උඩරට නර්තන සම්ප්‍රදායට අයත් ප්‍රධාන ඇඳුම් කට්ටලය හඳුන්වන්නේ,
(1) වෙස් ඇඳුම් කට්ටලය නමිනි. (2) තෙල්මේ ඇඳුම් කට්ටලය නමිනි.
(3) පබළු ඇඳුම් කට්ටලය නමිනි. (4) භරත ඇඳුම් කට්ටලය නමිනි.

20. ගැටබෙරය ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ලෙස භාවිත කරනුයේ,
(1) සබරගමු නැටුම් සඳහා. (2) පහතරට නැටුම් සඳහා.
(3) උඩරට නැටුම් සඳහා. (4) භරත නැටුම් සඳහා.

## III පහතරට

16. පහතරට නර්තන සම්ප්‍රදායෙහි පාද හුරු කරගැනීම සඳහා කරනු ලබන අභ්‍යාස හඳුන්වන්නේ,
(1) ගොඩ සරඹ නමිනි. (2) පා සරඹ නමිනි.
(3) ඉරට්ටිය නමිනි. (4) දොඹින පද නමිනි.

17. ''කිට ගුද තා'' මේ ලෙස නටනු ලබන්නේ,
(1) පළමු වන ඉලංගම් සරඹයේ ඉරට්ටියයි. (2) පළමු වන පා සරඹයේ හමාර පදයයි.
(3) දෙවන ඉලංගම් සරඹයේ ඉරට්ටියයි. (4) දෙවන ගොඩ සරඹයේ කස්තිරමයි.

18. "සොබන එ නාරද සිරිනි විරාගය ................... වීණා ගනු රාගය'' මෙම කවි පදයේ හිස්තැනට අදාළ වචන යුගලය වන්නේ,
(1) කියන මියුරු (2) සුලලිත රාගය (3) අසන මතින් (4) සමන වෙමින්

19. පහතරට නර්තන සම්ප්‍රදායට අයත් ප්‍රධාන ඇඳුම් කට්ටලයකි,
(1) තෙල්මේ ඇඳුම් කට්ටලය. (2) වෙස් ඇඳුම් කට්ටලය.
(3) පබළු ඇඳුම් කට්ටලය. (4) භරත ඇඳුම් කට්ටලය.

20. යක් බෙරය ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ලෙස භාවිත කරනුයේ,
(1) සබරගමු නැටුම් සඳහා. (2) උඩරට නැටුම් සඳහා.
(3) පහතරට නැටුම් සඳහා. (4) භරත නැටුම් සඳහා.

## IV සබරගමු

16. සබරගමු නර්තන සම්ප්‍රදායෙහි පාද හුරු කරගැනීම සඳහා කරනු ලබන අභ්‍යාස හඳුන්වන්නේ,
(1) ගොඩ සරඹ නමිනි. (2) දොඹින පද නමිනි.
(3) පා සරඹ නමිනි. (4) කලාසම නමිනි.

17. "කුදිතග තිතගත ගතිගත කුදගත කුදිත ගතිත කුද ගතිතකු දිත්තත්" මේ ලෙස නටනු ලබන්නේ,
(1) පළමු වන ඉලංගම් සරඹයේ ඉරට්ටියය.
(2) පළමු වන ගොඩ සරඹයේ කස්තිරමයි.
(3) මාත්‍රා පදහි කලාසමකි.
(4) පළමු වන පා සරඹයේ හමාර පදයයි.

18. "එකලා මහරාජ නරාදිප .................. සිංහාසන පිට" මෙම කවි පදයේ හිස්තැනට අදාළ වචන යුගලය වන්නේ,
(1) ගුවනත කියලා. (2) සිට එකලා.
(3) පවන් වේගයෙන්. (4) වැඩලා ඉඳ.

19. සබරගමු නර්තන සම්ප්‍රදායට අයත් ඇඳුම් කට්ටලය හඳුන්වන්නේ,
(1) පබළු ඇඳුම් කට්ටලය නමිනි. (2) වෙස් ඇඳුම් කට්ටලය නමිනි.
(3) තෙල්මේ ඇඳුම් කට්ටලය නමිනි. (4) භරත ඇඳුම් කට්ටලය නමිනි.

20. දවුල ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ලෙස භාවිත කරනුයේ,
(1) පහතරට නැටුම් සඳහා. (2) උඩරට නැටුම් සඳහා.
(3) සබරගමු නැටුම් සඳහා. (4) භරත නැටුම් සඳහා.

(ල. 1 x 20 = 20)

## II කොටස

❖ පළමු වන ප්‍රශ්නය සඳහා සියලු ම දෙනා පිළිතුරු සැපයිය යුතුය.
❖ දෙවන, තුන් වන හා හතර වන ප්‍රශ්නවලින් ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න.
❖ පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න සංඛ්‍යාව <u>පළමු වන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකි.</u>

---

1. (i) ඔබ ප්‍රදේශයේ පවත්නා පෙරහැරක දුටු නර්තන අංග දෙකක් නම් කරන්න.
(ii) එම පෙරහැරේ වාදනය කළ වාදන භාණ්ඩ දෙකක් නම් කරන්න.
(iii) පෙරහැරක දැකිය හැකි විවිධ සැරසිලි දෙකක් ලියන්න.
(iv) පෙරහැරක ඇතුළත් නර්තන අංග නොවන වෙනත් අංග දෙකක් ලියන්න.
(v) පෙරහැරක් පැවැත්වීමේ දී මිනිසුන් කටයුතු කරන ආකාරය විවිධය. එහිදී අපට දැකගත හැකි යහපත් ගුණාංග දෙකක් ලියන්න. (ල. 2 x 5 = 10)

2. A, B හා C කොටස් අතරින් එක් කොටසකට පමණක් පිළිතුරු සපයන්න.

| | A | B | C | |
|---|---|---|---|---|
| (i) | උඩරට නර්තන සම්ප්‍රදායෙහි හනුමා වන්නමට අයත්, තිත් රූපය නම් කරන්න.<br>.................................... | පහතරට නර්තන සම්ප්‍රදායෙහි සරළ කවි තාලයට අයත්, තිත් රූපය නම් කරන්න.<br>.................................... | සබරගමු නර්තන සම්ප්‍රදායෙහි අනිලා වන්නමට අයත්, තිත් රූපය නම් කරන්න.<br>.................................... | (ල. 2) |
| (ii) | බෙර පදය ලියන්න.<br>....................................<br>.................................... | බෙර පදය ලියන්න.<br>....................................<br>.................................... | දවුල් පදය ලියන්න.<br>....................................<br>.................................... | (ල. 3) |
| (iii) | කස්තිරම ලියන්න.<br>....................................<br>....................................<br>....................................<br>.................................... | ඉරට්ටිය ලියන්න.<br>....................................<br>....................................<br>....................................<br>.................................... | කලාසම ලියන්න.<br>....................................<br>....................................<br>....................................<br>.................................... | (ල. 5) |

3. (i) සිංහල හා දෙමළ අවුරුදු උත්සව සමයේ දැකිය හැකි චාරිත්‍ර දෙකක් ලියන්න. (ල. 2)
(ii) අවුරුදු උත්සව සමයේ දක්නට ලැබෙන ජන ක්‍රීඩාවක් නම් කර ඒ සඳහා භාවිත කවියක් ලියන්න. (ල. 3)
(iii) සිංහල හා දෙමළ අවුරුදු උත්සව සමයේ ඔබ දුටු වාදන අංගයක් නම් කර එය ඉදිරිපත් කළ ආකාරය කෙටියෙන් ලියන්න. (ල. 5)

4. (i) ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදාය නම් කරන්න. (ල. 2)
(ii) එම නර්තන සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශ තුනක් ලියන්න. (ල. 3)
(iii) ලබා දී ඇති ලංකා සිතියමෙහි එම ප්‍රදේශ තුන ලකුණු කරන්න. (ල. 5)

